මගේ අංකය : DL/E/21/09/HRDO EB
ආයතන අංශය
කම්කරු දෙපාර්තමේන්තුව
කොළඹ 05
2022.04.

සියළුම කම්කරු කොමසාරිස්වරුන්/නියෝජ්‍ය කම්කරු කොමසාරිස්වරුන්/ සහකාර කම්කරු කොමසාරිස්වරුන්/ දිස්ත්‍රික් කර්මාන්ත ශාලා පරීක්ෂක ඉංජිනේරුවරුන්/ජ්‍යෙෂ්ඨ කම්කරු නිලධාරීන්,

**මානව සම්පත් සංවර්ධන නිලධාරීන් සඳහා I හා II වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ - 2022**

කම්කරු දෙපාර්තමේන්තුවේ ආශ්‍රිත නිලධාරි ගණය සඳහා 2010.06.16 දිනෙන් අනුමත බඳවා ගැනීමේ පරිපාටිය අනුව, මානව සම්පත් සංවර්ධන නිලධාරි තනතුරේ III වන ශ්‍රේණියට පත්වී වසර 3 ක් ගතවීමට පෙර I වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් විය යුතු අතර, II ශ්‍රේණියට උසස් වී වසර 03ක් ගත වීමට පෙර II වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් විය යුතුය.

02. ඒ අනුව මානව සම්පත් සංවර්ධන නිලධාරීන් සඳහා වන 2022 වසරට අදාළව පැවැත්විය යුතු I වන හා II වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ **2022 මැයි මාසයේදී** කම්කරු දෙපාර්තමේන්තුවේ දී පැවැත්වීමට සැලසුම් කර ඇත.

03. මේ සම්බන්ධයෙන් නිකුත් කර ඇති අයදුම්පත් කැඳවීමේ නිවේදනය හා ආදර්ශ අයදුම්පත්‍රයේ පිටපතක් මේ සමඟ අමුණා එවමි.

04. ඔබ අංශයේ/ කලාපයේ සියලුම මානව සම්පත් සංවර්ධන නිලධාරීන් මේ සම්බන්ධයෙන් දැනුවත් කරන ලෙස දන්වමි. ඉදිරිපත් කරන අයදුම්පත් හි අංක 08 ඡේදයේ ඉල්ලුම්කරු ගේ ආසන්නතම අධීක්ෂණ නිලධාරියාගේ නිර්දේශය සහිතව **2022.04.29** දින හෝ ඊට පෙර මා වෙත ඉදිරිපත් කරන මෙන් කාරුණිකව දන්වමි.

05. මෙම පරීක්ෂණයට පළමුවරට ඉල්ලුම් කරන අපේක්ෂකයින් ගෙන් හැර අනෙකුත් සියළුම අපේක්ෂකයින්ගෙන් පහත සඳහන් පරිදි විභාග ගාස්තු අය කරනු ලැබේ.

- එක් විෂයයක් සඳහා රු:300/=
- එක් විෂයයකට වැඩි විෂයයන් ගණනක් සඳහා රු: 500/=

06. විභාග ගාස්තු ගෙවීම

අපේක්ෂකයා විසින්, පොදු 118 ආකෘති පත්‍රය විභාගයේ නම හා ලැබීම් ශීර්ෂය 2003.02.99 ලෙස සටහන් කර මෙම නිවේදනයේ පිටපතක් ද සමග අයදුම්පත් භාර ගන්නා අවසාන දින හෝ එදිනට පෙර අපේක්ෂකයා සේවය කරනු ලබන කාර්යාලයේ මුදල් අයකැමි වෙත හෝ ප්‍රධාන කාර්යාලයේ සරප් අංශය වෙත හෝ අපේක්ෂකයා සේවය කරනු ලබන කාර්යාලයේ මුදල් අයකැමිවරයකු නොමැති නම් අපේක්ෂකයාට ලඟා වීමට පහසු කම්කරු දෙපාර්තමේන්තුවේ වෙනත් ඕනෑම කාර්යාලයක මුදල් අයකැමිවරයකු වෙත හෝ ඉදිරිපත් කළ යුතු අතර මුදල් ගෙවා ලබා ගත් ලදුපත (පොදු 172) ඉල්ලුම් පත්‍රයේ අදාළ ස්ථානයේ නොගැලවෙන සේ ඇලවිය යුතුය.
**(මෙම ලදුපතේ ඡායා පිටපතක් අපේක්ෂකයා ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.)**

සටහන : විභාගය අවලංගු කළහොත් මිස විභාග ගාස්තු කුමන හේතුවක් නිසාවත් නැවත ගෙවනු නොලැබේ. මෙම විභාගය සඳහා ගෙවනු ලැබූ විභාග ගාස්තු වෙනත් විභාගයක් සඳහා මාරු කිරීමට ද නොහැකිය.

එච්.ටී.පී. අබයරත්න
කම්කරු කොමසාරිස් (පාලන)
කම්කරු දෙපාර්තමේන්තුව
කොළඹ 05

එච්.ටී.පී. අබයරත්න
කම්කරු කොමසාරිස් (පාලන)

අත්/කළේ: බී.කේ.ප්‍රභාත් චන්ද්‍රකීර්ති
කම්කරු කොමසාරිස් ජනරාල්

පිටපත : 01. ලේකම්, කම්කරු අමාත්‍යාංශය
02. ප්‍රධාන ගණකාධිකාරී - අවශ්‍ය කටයුතු සඳහා
03. ලේකම්, මානව සම්පත් සංවර්ධන නිලධාරීන්ගේ සංගමය

## කම්කරු දෙපාර්තමේන්තුව

### මානව සම්පත් සංවර්ධන නිලධාරීන් සඳහා පළමු හා දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ - 2022

මානව සම්පත් සංවර්ධන නිලධාරීන් සඳහා වන I හා II කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ 2022 මැයි මස කම්කරු දෙපාර්තමේන්තුවේ දී පැවැත්වීමට සැලසුම් කර ඇත.

**01. විභාග පරිපාටිය**

1.1 I වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය (III ශ්‍රේණියේ මානව සම්පත් සංවර්ධන නිලධාරීන් සඳහා)

| විෂයයන් | විෂය නිර්දේශය | කාලය |
|---|---|---|
| (1) ආයතන ක්‍රම හා කාර්යාල කළමනාකරණය | ආයතන සංග්‍රහයේ II,III, IV, VII, VIII, XII, XIV, XLVIIසහ XLVIIIපරිච්ඡේද පිළිබඳ දැනුම හා රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති 1 බණ්ඩයේ පරිච්ඡේද පිළිබඳ දැනුම සහ තනතුරට අදාළ වන පරිදි රජයේ කාර්යාලවල භාවිතා වන කාර්යාල ක්‍රම පිළිබඳ මූලික දැනුම හා එම දැනුම ප්‍රායෝගිකව භාවිතා කිරීමේ හැකියාව පරීක්ෂා කිරීම සහ රාජකාරී ලිපිලේඛන මැනවින් අවබෝධ කොට ගෙන පැහැදිලි හා සංක්ෂිප්ත සටහන් මගින් තම අදහස් නිරීක්ෂණ නිශ්චිත අන්දමින් ඉදිරිපත් කිරීමේ හැකියාව සහ නියෝගය අනුව ලිපියක් කෙටුම්පත් කිරීමේ හැකියාව ද පරීක්ෂා කෙරේ.(ආයතන සංග්‍රහයේ XXVIII පරිච්ඡේදය ආශ්‍රයෙන්) | පැය 02 |
| (2)මූල්‍ය කළමනාකරණය | මුදල් රෙගුලාසි සංග්‍රහයේ 02, 50, 56, 124,126,127, 135, 136, 137, 138, 139, 365 සහ 366 මුදල් රෙගුලාසි ඇසුරෙන් තනතුරට අදාල වන පරිදි රජයේ කාර්යාලවල භාවිතා වන මූලික ගිණුම් හා මුදල් පාලන පොත්වල කාර්යයන් පිළිබඳව අවබෝධය හා දැනුම මැනීම අපේක්ෂා කෙරේ. | පැය 02 |
| (3)පරිගණක තාක්ෂණය | 01. තොරතුරු තාක්ෂණය පිළිබඳව හැඳින්වීම<br>02. තොරතුරු ලේඛනගත කිරීම<br>03. දත්ත විශ්ලේෂණය කිරීම<br>04. තොරතුරු ඉදිරිපත් කිරීම<br>05. තොරතුරුසන්නිවේදනය<br>ඉහත සඳහන් මාතෘකාවලට ගැලපෙන පරිදි පැය 01 ක බහුවරණ ප්‍රශ්න පත්‍රයක් හා MS-OFFICE සහ INTERNET EXPLORER ආශ්‍රයෙන් පැය 02 ක ප්‍රායෝගික පරීක්ෂණයක් පැවැත්වේ. | පැය 03 |

එක් විෂයයකට අවම ලකුණු 40% ක් ලබාගත් අපේක්ෂකයින් එම විෂයය සමත් ලෙස සැලකේ.

**1.2 II වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය (II ශ්‍රේණියේ මානව සම්පත් සංවර්ධන නිලධාරීන් සඳහා)**

| විෂයයන් | විෂය නිර්දේශය | කාලය |
|---|---|---|
| (1) ආයතන ක්‍රම හා කාර්යාල කළමනාකරණය | ආයතන සංග්‍රහයේ II,III, IV, VII, VIII, XII, XIV, XXVII, XXXII, XLVIIසහ XLVIIIපරිච්ඡේද පිළිබඳ දැනුම හා රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති 1 ඛණ්ඩයේ සියළුම පරිච්ජේද පිළිබඳ දැනුම සහ තනතුරට අදාළ වන පරිදි රජයේ කාර්යාලවල භාවිතා වන කාර්යාල ක්‍රම පිළිබඳ මූලික දැනුම හා එම දැනුම ප්‍රායෝගිකව භාවිතා කිරීමේ හැකියාව පරීක්ෂා කිරීම සහ රාජකාරි ලිපිලේඛන මැනවින් අවබෝධ කොට ගෙන පැහැදිළි හා සංක්ෂිප්ත සටහන් මගින් තම අදහස් නිරීක්ෂණ නිශ්චිත අන්දමින් ඉදිරිපත් කිරීමේ හැකියාව සහ නියෝගය අනුව ලිපියක් කෙටුම්පත් කිරීමේ හැකියාව ද පරීක්ෂා කෙරේ.<br>(ආයතන සංග්‍රහයේ XXVIII පරිච්ඡේදය ආශ්‍රයෙන්) | පැය 02 |
| (2)මූල්‍ය කළමනාකරණය | මුදල් රෙගුලාසි සංග්‍රහයේ 02, 50, 56, 58, 124, 125, 126, 127, 128, 135, 136, 137, 138, 139, 365, 366, 369, 370 සහ 373 මුදල් රෙගුලාසි ඇසුරෙන් තනතුරට අදාළ වන පරිදි රජයේ කාර්යාලවල භාවිතා වන මූලික ගිණුම් හා මුදල් පාලන පොත්වල කාර්යයන් පිළිබඳව අවබෝධය හා දැනුම මැනීම අපේක්ෂා කෙරේ. | පැය 02 |
| (3)කුසලතා ගොඩනැගීම | සමීක්ෂණ සංවිධානය, තොරතුරු රැස් කිරීම සඳහා වන ආකෘතීන් නිර්මාණය කිරීම, එක් රැස් කළ තොරතුරු විශ්ලේෂණය, සකස් කොට බෙදා හැරීම, වාර්තා/ප්‍රගති වාර්තා සකස් කිරීම ඇතුළු ඒ ඒ තනතුරෙහි කාර්ය භාරයට අදාළ දැනුම හා කුසලතා මැන බැලීමේ ප්‍රශ්න පත්‍රයකි. | පැය 02 |

එක් විෂයයකට අවම ලකුණු 40% ක් ලබාගත් අපේක්ෂකයින් එම විෂයය සමත් ලෙස සැලකේ.

**02 අයදුම්පත් ඉදිරිපත් කිරීම :**

මෙම පරීක්ෂණයට පෙනී සිටීමට බලාපොරොත්තු වන අපේක්ෂකයින් මෙම නිවේදනයේ අවසානයේ ඇති ආදර්ශ ආකෘති පත්‍රයට අනුකූලව A4කඩදාසියක දෙපැත්තම පාවිච්චි කරමින්අංක 01 සිට 05 දක්වා ඡේද එක් පිටුවකටත්, ඉතිරි කොටස අනෙක් පිටුවටත් වන සේ සකසා ගත් අයදුම්පත් අධීක්ෂණ නිලධාරියාගේ නිර්දේශය සහිතව **<u>2022.04.29 දින හෝ ඊට ප්‍රථම කම්කරු කොමසාරිස් ජනරාල්</u>** වෙත ලැබෙන සේ එවිය යුතුය. අයදුම්පත් බහාලන කවරයේ වම්පස උඩ කෙළවරේ **<u>"මානව සම්පත් සංවර්ධන නිලධාරීන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ - 2022 මැයි"</u>** යනුවෙන් සඳහන් කළ යුතුය. එදිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. එක් එක් පරීක්ෂණය සඳහා වෙන වෙනම අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය.

**03. විභාග ගාස්තු :**

මෙම පරීක්ෂණයට පළමුවරට ඉල්ලුම් කරන අපේක්ෂකයින්ගෙන් හැර අනෙකුත් සියලුම අපේක්ෂකයින්ගෙන් එක් එක් කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ සඳහා පහත සඳහන් පරිදි විභාග ගාස්තු අය කරනු ලැබේ.

- එක් විෂයයක් සඳහා රුපියල් 300/=
- එක් විෂයයට වැඩි විෂයයන් ගණනක් සඳහා රුපියල් 500/=

**04. විභාග ගාස්තු ගෙවීම :**

අපේක්ෂකයා විසින්, පොදු 118 ආකෘති පත්‍රයෙහි විභාගයේ නම හා ලැබීම් ශීර්ෂය 2003.02.99 ලෙස සටහන් කර මෙම නිවේදනයේ පිටපතක් ද සමග අයදුම්පත් භාර ගන්නා අවසාන දින හෝ එදිනට පෙර අපේක්ෂකයා සේවය කරනු ලබන කාර්යාලයේ මුදල් අයකැමි වෙත හෝ ප්‍රධාන කාර්යාලයේ සරප් අංශය වෙත හෝ අපේක්ෂකයා සේවය කරනු ලබන කාර්යාලයේ මුදල් අයකැමිවරයකු නොමැති නම් අපේක්ෂකයාට ලඟා වීමට පහසු කම්කරු දෙපාර්තමේන්තුවේ වෙනත් ඕනෑම කාර්යාලයක මුදල් අයකැමිවරයකු වෙත හෝ ඉදිරිපත් කළ යුතු අතර මුදල් ගෙවා ලබා ගත් ලදුපත (පොදු 172) ඉල්ලුම් පත්‍රයේ අදාළ ස්ථානයේ නොගැලවෙන සේ ඇලවිය යුතුය.

**(මෙම ලදුපතේ ඡායා පිටපතක් අපේක්ෂකයා ලඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.)**

| |
|---|
| සටහන : විභාගය අවලංගු කළහොත් මිස විභාග ගාස්තු කුමන හේතුවක් නිසාවත් නැවත ගෙවනු නොලැබේ. මෙම විභාගය සඳහා ගෙවනු ලැබූ විභාග ගාස්තු වෙනත් විභාගයක් සඳහා මාරු කිරීමට ද නොහැකිය. |

**05. විභාගයට පෙනී සිටීමට සුදුසුකම් :**

මෙම නිවේදනය සැලකිල්ලෙන් කියවා ඉල්ලා ඇති සියලුම තොරතුරු සම්පූර්ණ කර, අයදුම්පත් නියමිත දිනට හෝ ඊට පෙර ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය. මෙම නිවේදනයේ අවශ්‍යතාවයන්ට අනුකූල නොවන අයදුම්පත් වෙතොත් ඒවා ප්‍රතික්ෂේප කිරීමට සිදුවනු ඇත.

**06. විභාගයට ඇතුළත් කර ගැනීම හා ප්‍රවේශ පත්‍ර නිකුත් කිරීම:**

අයදුම්පත් ඉදිරිපත් කර ඇති සුදුසුකම් සපුරා තිබෙන සියලුම අයදුම්කරුවන් වෙත ප්‍රවේශ පත්‍ර හා කාල සටහන් කම්කරු කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කරනු ලැබේ.

**07.** විභාගයට පෙනී සිටීම සඳහා පැමිණීම වෙනුවෙන් ගමන් වියදම් හෝ සංයුක්ත දීමනා කිසිවක් ගෙවනු නොලැබේ.

එච්.ටී.ෂී. අබයරත්න
කම්කරු කොමසාරිස් (පාලන)
කම්කරු දෙපාර්තමේන්තුව

**එච්.ටී.ෂී. අබයරත්න**
කම්කරු කොමසාරිස් (පාලන)

**අත්/කළේ: බී.කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති**
කම්කරු කොමසාරිස් ජනරාල්

දිනය: 2022.04. 06

ආදර්ශ අයදුම්පත්‍රය

| |
|---|
| |

කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා

**කම්කරු දෙපාර්තමේන්තුව**

**මානව සම්පත් සංවර්ධන නිලධාරින් සඳහා ............. වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය**

**2022**

01. 1.1 අයදුම්කරුගේ මූලකරු සමග නම : (සිංහලෙන්) :..........................................

........................................................................................................

1.2 අයදුම්කරුගේ මූලකරු සමග නම : (ඉංග්‍රීසියෙන්) : ..........................................

........................................................................................................

1.3 සම්පූර්ණ නම : (සිංහලෙන්) : ..........................................

........................................................................................................

1.4 සම්පූර්ණ නම (ඉංග්‍රීසියෙන්):..........................................

........................................................................................................

02. 2.1 තනතුර හා ශ්‍රේණිය :..........................................

2.2 එම ශ්‍රේණියට පත්වූ දිනය: ..........................................

03. 3.1 ප්‍රවේශ පත්‍ර එවිය යුතු ලිපිනය :(සිංහලෙන්).:..........................................

........................................................................................................

3.2 ප්‍රවේශ පත්‍ර එවිය යුතු ලිපිනය : (ඉංග්‍රීසියෙන්):..........................................

........................................................................................................

3.3 රාජකාරී ස්ථානය හා එහි ලිපිනය :..........................................

3.4 දුරකථන අංක : රාජකාරී : [ ] [ ]

04. 4.1 ජාතික හැඳුනුම්පත් අංකය : [ ][ ][ ][ ][ ][ ][ ][ ][ ][ ][ ][ ]

4.2 උපන් දිනය : [ ][ ][ ][ ] [ ][ ] [ ][ ]

4.3 ස්ත්‍රී පුරුෂ භාවය [ ]

05. 5.1 විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය : [ ]

5.2 ඉල්ලුම් කරන පරීක්ෂණය : [ ]

5.3 පෙනී සිටීමට බලාපොරොත්තු වන විෂයය/විෂයයන් :

| | |
|---|---|
| | |
| | |
| | |

06. 6.1 ඔබ මෙම පරීක්ෂණයට ඉල්ලුම් කරනුයේ පළමු වරට ද?

6.2 ඉහත 6.1 ට පිළිතුර "නැත" නම් නිවේදනයේ 03 ඡේදයට අනුව විභාග ගාස්තු ගෙවන ලද කාර්යාලය: ..............................................................................................

6.3 මුදල් ගෙවන ලද කුවිතාන්සියේ අංකය හා දිනය :

..............................................................................................

..............................................................................................

(මුදල් ගෙවන ලද කුවිතාන්සිය නොගැලවෙන සේ එක් කෙළවරකින් මෙහි අලවන්න. එහි ඡායා පිටපතක් ඔබ ළග තබා ගන්න.)

07. අයදුම්කරුගේ ප්‍රකාශය :

(අ) මෙම අයදුම්පත්‍රයෙහි මා විසින් සපයා ඇති තොරතුරු සත්‍ය හා නිවැරදි බව සහතික කරමි.

(ආ) මෙම විභාගයට අදාළ සියලුම කොන්දේසි පිළිපැදීමට මම එකඟ වෙමි.

දිනය : අයදුම්කරුගේ අත්සන

**08 කාර්යාල/අංශ ප්‍රධානියාගේ නිර්දේශය :**

මෙම අයදුම්පත්‍රය ඉදිරිපත් කරන ඉහත අත්සන යෙදූ නිලධාරියා/නිලධාරිනිය මෙම කාර්යාලයේ/අංශයේ සේවය කරන බව සහතික කරන අතර, අයදුම්පත නිර්දේශ කර ඉදිරිපත් කරමි.

දිනය : කාර්යාල/අංශ ප්‍රධානියාගේ අත්සන

නිල මුද්‍රාව

**09. දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය**

(i) ඉහත සපයා ඇති විස්තර පරීක්ෂා කර බැලූ බවත්, ඒවා නිවැරදි බවත්,

(ii) අපේක්ෂකයා/ අපේක්ෂිකාව මෙම විභාගයට පෙනී සිටීමට සුදුසු බවත් සහතික කරමි.

දිනය: දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන